9152

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
# கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
# General Certificate of Education (Adv. Level) Examination, August 2017

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம் I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 08 | |
| 02 | 09 - 18 | |
| 03 | 19 - 33 | |
| 04 | 34 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** රාග ජාතිය පිළිබඳ මත කිහිපයකින් යුත් කාෆි මේලගත රාගයක් වනුයේ,
(1) බාගේශ්‍රී ය. (2) ජයජයවන්ති ය. (3) බ්‍රින්දාබනී සාරංග ය.
(4) බහාර් ය. (5) භීම්පලාසි ය. (......)

**2.** | ගුම ධනි | සංධ නිධ මධ | ගුම සග | නිස ධනි ස – | යන තානාලංකාරය අයත් රාගය කුමක් ද?
(1) ජෞනපුරි (2) භීම්පලාසි (3) බාගේශ්‍රී
(4) මාල්කෞන්ස් (5) බ්‍රින්දාබනී සාරංග (......)

**3.** ආසාවරී සහ ජෞනපුරි රාග යුගලය
(1) සමප්‍රකෘති රාග වේ. (2) උදය සන්ධි ප්‍රකාශ රාග වේ.
(3) පරමේල ප්‍රවේශක රාග වේ. (4) සන්ධ්‍යා සන්ධි ප්‍රකාශ රාග වේ.
(5) පූර්වාංගවාදී රාග වේ. (......)

**4.** සදාරංග සහ අදාරංග යන සංගීතඥයින් දෙදෙනා විසින් ප්‍රචලිත කරන ලද ගායන ශෛලිය කුමක් ද?
(1) ධ්‍රැපද් (2) ධමාර් (3) ඛයාල් (4) චතුරංග (5) තුම්රි (......)

**5.** ආරෝහණ, අවරෝහණ ක්‍රමය සෘජුවම භාවිත කරන තාන් වර්ගය හඳුන්වන්නේ,
(1) කූට තාන් නමිනි. (2) වක්‍ර තාන් නමිනි. (3) සපට් තාන් නමිනි.
(4) බෝල් තාන් නමිනි. (5) මිශ්‍ර තාන් නමිනි. (......)

**6.** භාරතීය පද්‍ය ප්‍රබන්ධිකාවක වන 'මීරාබායි' ප්‍රසිද්ධියක් උසුලන ගායන ශෛලිය කුමක් ද?
(1) ධ්‍රැපද් (2) භජන් (3) ඛයාල් (4) ගසල් (5) තුම්රි (......)

**7.** තිහායි, මීන්ඩ්, ගමක්, ඛටලා යන ශිල්ප ක්‍රම සියල්ලම යොදා ගත හැක්කේ,
(1) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක දී ය. (2) ශාස්ත්‍රීය ඛයාල් ගායනයක දී ය.
(3) ශාස්ත්‍රීය සන්තූර් වාදනයක දී ය. (4) ශාස්ත්‍රීය ධ්‍රැපද් ගායනයක දී ය.
(5) ශාස්ත්‍රීය වයලින් වාදනයක දී ය. (......)

**8.** කර්ණාටක තාල පද්ධතිය ගොඩනැගී ඇත්තේ,
(1) මූලික තාල 8ක් හා ජාති 4ක් වශයෙනි. (2) මූලික තාල 7ක් හා ජාති 5ක් වශයෙනි.
(3) මූලික තාල 6ක් හා ජාති 6ක් වශයෙනි. (4) මූලික තාල 5ක් හා ජාති 7ක් වශයෙනි.
(5) මූලික තාල 4ක් හා ජාති 8ක් වශයෙනි. (......)

[ දෙවැනි පිටුව බලන්න.

**9.** "ගායනය, වාදනය සහ නර්තනය යන අංග තුනෙහි මනා වූ සංකලනය සංගීතයයි." යනුවෙන් සංගීතය නිර්වචනයකර තිබෙන පැරණිම සංගීත ග්‍රන්ථය කුමක් ද?
(1) ලක්ෂ්‍ය සංගීත් (2) සංගීත රත්නාකරය
(3) ක්‍රමික් පුස්තක් මාලිකා (4) රාග තරංගිනී
(5) රාග විඥාන (……)

**10.** ඨේකාවට අයත් මුළු මාත්‍රා සංඛ්‍යාව මෙන්ම විභාග බෙදීම් ද **අසමාන** වන තාල දෙකක් වන්නේ,
(1) ඒක්තාල් සහ චෞතාල් ය. (2) තිලවඩා සහ ත්‍රිතාල් ය.
(3) රූපක් සහ තීව්‍රා ය. (4) ත්‍රිතාල් සහ පංජාබි ය.
(5) රූපක් සහ දීප්චන්දි ය. (……)

**11.** 'ස නි̣ ධ̣ ස, ම <u>ග</u> රි ස' වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය කුමක් ද?
(1) බහාර් (2) හමීර් (3) බාගේශ්‍රී
(4) භීම්පලාසි (5) මාල්කෞන්ස් (……)

**12.** ආකෘතියෙන් ද, වාදන ශිල්ප ක්‍රම හා ධ්වනි ගුණයෙන් ද වඩාත් සමාන සංගීත භාණ්ඩ යුගලය තෝරන්න.
(1) තබ්ලාව - පඛාවාජ් (2) සිතාර් - සරෝද් (3) එස්රාජ් - දිල්රුබා
(4) ෂනායි - බටනලා (5) ස්වර මණ්ඩලය - සන්තූර් (……)

● අංක **13** සිට **15** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත වගුව උපයෝගි කරගන්න.

| අන්තරා කොටසෙහි යෙදෙන ස්වර සංගතිය | වාදි ස්වරය | සංවාදි ස්වරය | වක්‍ර ස්වරය | විකෘති ස්වර | රාගය |
|---|---|---|---|---|---|
| ප නි ස̇ | රි | ප | රි | <u>නි</u> | ……A…… |
| ප නි ස̇ | ග | නි | – | ම́ (විවාදි) | ……B…… |
| ප නි ස̇ | රි | ප | ප | <u>ග</u> <u>නි</u> | ……C…… |

**13.** ඉහත වගුවෙහි **A - B - C** සඳහා ගැළපෙන රාග තුන පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) බ්‍රින්දාබනී සාරංග - ජයජයවන්ති - තිලක්කාමෝද්
(2) තිලක්කාමෝද් - ජයජයවන්ති - දේස්
(3) බ්‍රින්දාබනී සාරංග - දේස් - තිලක්කාමෝද්
(4) දේස් - බිහාග් - ජයජයවන්ති
(5) දේස් - ජයජයවන්ති - බ්‍රින්දාබනී සාරංග (……)

**14.** **A** අක්ෂරයට අදාළ රාගයෙහි වක්‍ර ස්වරය යෙදෙන ස්වර සංගතිය තෝරන්න.
(1) ප ධ ම ග රි (2) රි ග රි ප ම (3) ස රි ම ග රි
(4) ම ග රි ග රි (5) ම ග රි ග ස (……)

**15.** **B** අක්ෂරයට අදාළ රාගයෙහි රාග ජාතිය කුමක් ද?
(1) සම්පූර්ණ – සම්පූර්ණ (2) ෂාඩව – සම්පූර්ණ
(3) ඖඩව – සම්පූර්ණ (4) ඖඩව – ෂාඩව
(5) ෂාඩව – ඖඩව (……)

● අංක **16** සිට **18** තෙක් ප්‍රශ්න සඳහා පහත දැක්වෙන සටහන උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
| ස ම | රි ප | ග ධ |

More Past Papers at
tamilguru.lk

**16.** **A** හි සඳහන් ස්වර පිළිබඳ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) භීම්පලාසි රාගයෙහි යෙදෙන ස්වර සංගතියක් වේ.
(2) පිළිවෙළින් ගත් විට බාගේශ්‍රී රාගයෙහි යෙදෙන වාදි හා සංවාදි ස්වර වේ.
(3) පූර්වාංගයෙහි යෙදෙන ස්වර දෙකක් වේ.
(4) සප්තකයෙහි යෙදෙන ප්‍රකෘති ස්වර දෙකක් වේ.
(5) සප්තකයෙහි යෙදෙන ශුද්ධ ස්වර දෙකක් වේ. (……)

**17.** **B** හි සඳහන් ස්වර දෙක වාදි සහ සංවාදි ලෙස යෙදෙන නිර්දේශිත රාග යුගලයකි,
(1) තිලක්කාමෝද් සහ බ්‍රින්දාබනී සාරංග. (2) බ්‍රින්දාබනී සාරංග සහ ජෞනපුරි.
(3) ජෞනපුරි සහ ජයජයවන්ති. (4) ජයජයවන්ති සහ හමීර්.
(5) හමීර් සහ දේස්. (……)

**18.** **C** හි සඳහන් ස්වර දෙකම වර්ජ්‍ය වන නිර්දේශිත රාගය කුමක් ද?
(1) බිහාග් (2) හමීර් (3) බහාර්
(4) බ්‍රින්දාබනී සාරංග (5) බාගේශ්‍රී (……)

[තුන්වැනි පිටුව බලන්න.

**19.** භාරතීය සංගීතයෙහි, හින්දුස්ථානි සහ කර්ණාටක වශයෙන් පද්ධති දෙකක් බිහි වූයේ,
(1) පර්සියානු සංගීතයේ බලපෑමෙන් පසුව ය.
(2) ගුරුකුල ක්‍රමය බිහි වීමෙන් පසුව ය.
(3) අපරදිග ජාතීන්ගේ බලපෑමට යටත් වීමෙන් පසුව ය.
(4) රබීන්ද්‍ර සංගීතය බිහි වීමෙන් පසුව ය.
(5) සංගීත අධ්‍යාපන ආයතන බිහි වීමෙන් පසුව ය. (......)

**20.** සිතාරය සහ වයලීනය යොදා ගනිමින් යුගල වාදන ඉදිරිපත් කළ ලෝක ප්‍රකට පෙරදිග හා අපරදිග වාද්‍ය ශිල්පීන් දෙදෙනකු වනුයේ,
(1) අලව්දීන් ඛාන් සහ සෙබෙස්තියන් බාක් ය.
(2) බිස්මිල්ලා ඛාන් සහ ජෝස් මැසිඩා ය.
(3) රවිශංකර් සහ යෙහුඩි මෙනුහින් ය.
(4) චෞරසියා සහ මොසාර්ට් ය.
(5) වී. ජී. ජෝග් සහ බීතෝවන් ය. (......)

**21.** පූර්වාලාප, ස්ථායි, අන්තරා, මධ්‍යාලාප, තාල පද, ස්වර අලංකාර, තිහායි යන කොටස් සියල්ල අන්තර්ගතව නිර්මාණය වූ රාගාශ්‍රිත සරල ශාස්ත්‍රීය ගීය තෝරන්න.
(1) වස්දඬු රාවේ (2) මුව මුක්තා ලතා (3) මන්නාරම් කන්‍යාරාමේ
(4) හංස රාජිනි (5) මම දෙව්දුනි දෙවොලට ආවේ (......)

**22.** ගැල් ගී, පැල් ගී, නැළවිලි ගී, පාරු ගී යන ගී වර්ග හතර සඳහා ම පොදුවේ අදාළ වන නිවැරදි කියමන තෝරන්න.
(1) සියලු ම ගී මෙහෙ ගී ගණයට අයත් වේ.
(2) සියලු ම ගී සමාජ ගී ගණයට අයත් වේ.
(3) සියලු ම ගී ඒකලව ගැයේ.
(4) සියලු ම ගී ආසාතාත්මකව ගැයේ.
(5) සියලු ම ගී සමූහ වශයෙන් ගැයේ. (......)

**23.** ආර්චික, ගාථික, සාමික, ස්වරාන්තරික වශයෙන් සංගීත ස්වර සප්තකයේ මූලික වර්ධන අවස්ථා ඇතුළත් ඓතිහාසික යුගය ලෙස සැලකෙන්නේ,
(1) මෝගල් යුගයයි. (2) බ්‍රිතාන්‍ය යුගයයි. (3) නූතන යුගයයි.
(4) වෛදික යුගයයි. (5) මොහෙන්ජෝදාරෝ හරප්පා යුගයයි. (......)

**24.** ආචාර්ය පණ්ඩිත් අමරදේවයන් විසින් ම නිර්මිත ගී තනු ඇතුළත් චිත්‍රපට නාමාවලිය තෝරන්න.
(1) ගැටවරයෝ, රන්මුතු දූව, මාතලන් (2) රන්මුතු දූව, ගැටවරයෝ, දෙලොවක් අතර
(3) දෙලොවක් අතර, සැඩසුළං, මාතලන් (4) රන්මුතු දූව, සැඩසුළං, දෙලොවක් අතර
(5) ගැටවරයෝ, සැඩසුළං, මාතලන් (......)

**25.** 'උත්තමවන් ලොව පතලා' යනුවෙන් ඇරඹෙන ගීතය අයත් වන ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදාය කුමක් ද?
(1) නාඩගම් (2) නූර්ති (3) සොකරි (4) කෝලම් (5) නවනාට්‍ය (......)

● අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ඡේදය උපයෝගී කරගන්න.

මංකාව භාවිතයෙන් තම වාද්‍ය භාණ්ඩයේ ප්‍රධාන තත සියුම් ලෙස සුසර කරගත් කෞමදී, තීව්‍ර මධ්‍යමය යෙදෙන ෂාඩව-සම්පූර්ණ ජාතියට අයත් නිර්දේශිත රාගයකට අදාළ ගත් වාදනයක් මධ්‍යලයෙන් ඉදිරිපත් කළා ය. ඇය විසින් සමස්ථානයෙන් ආරම්භ කරන ලද එම ගත් වාදනය නැවත සමස්ථානයට පැමිණියේ මාත්‍රා 12 කට පසුව ය.

**26.** කෞමදී වැයූ සංගීත භාණ්ඩය නම් කරන්න. ..................................................

**27.** වාදනය සඳහා ඇය තම දබරැඟිල්ලෙහි රඳවාගත් උපාංගය කුමක් ද? ..................................................

**28.** ඇය විසින් වයන ලද රාගය නම් කරන්න. ..................................................

**29.** එම රාගයේ ආරෝහණයෙහි යෙදෙන වක්‍ර ස්වරය ලියා දක්වන්න. ..................................................

**30.** කෞමදී, ගත් වාදනය සඳහා යොදාගත් තාලය නම් කරන්න. ..................................................

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුර යොදන්න.

**31.** බ්‍රින්දාබනී සාරංග රාගයට අනුව ගොඩනැගෙන රි ම රි ස නි ස, ම ප ම රි ස රි, යන ස්වර අභ්‍යාසයේ ඊළඟ ස්වර ඛණ්ඩය වනුයේ .................................. ය.

**32.** කණ්ඩායම් සංගීත ශෛලියේ ගීයක් පළමු වරට ශ්‍රී ලංකාවේ චිත්‍රපට දර්ශනයකට යොදා ගත්තේ.................. චිත්‍රපටය සඳහා ය.

**33.** අලගනායිදු නම් ද්‍රවිඩ සංගීතඥයා විසින් නිපදවන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම නාඩගම .................. නම් වේ.

[ හතරවැනි පිටුව බලන්න.

**34.** 'කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත' යන ගෞරව නාමයෙන් පිදුම් ලද ..................................... රජතුමා කව්සිළුමිණ ගී කාව්‍යය ද රචනා කළේ ය.

**35.** පොළොන්නරු යුගයේ දී රාජසභා සංගීත ක්‍රියාකාරකම් සඳහා මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පිහිටුවන ලද්දේ ..................................... මණ්ඩපයයි.

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.

**36.** 'පෙමාදරවූ මගෙ රූසිරු ලඳලිය මෙවදනා' යනුවෙන් ඇරඹෙන ගී පාදය ඇතුළත් කෝලමෙහි නම කුමක් ද?

.....................................................................................................................................

**37.** පද්‍ය පාඨ අතරට ගද්‍ය පාඨ ද ඇතුළත් හාස්‍යෝත්පාදක ගැමි ගී විශේෂය නම් කරන්න.

.....................................................................................................................................

**38.** විශාරද නන්දා මාලිනී විසින් ගායනා කරන ලද 'රුක් අත්තන මල මුදුනේ' ගීතය නිර්මාණය කිරීම සඳහා පාදක කරගත් ජන සංගීතාංගය නම් කරන්න.

.....................................................................................................................................

**39.** |ප ස ස | ස - ස ස | නි නි නි | ධ - නි ධ | යනුවෙන් ස්වර ප්‍රස්තාරය ඇරඹෙන ජන ගීතයේ මුල් පාදය ලියන්න.

.....................................................................................................................................

**40.** 'ලේසි නොව බැඳ අල්ලා' යන හටන් ගීය ගැයෙන දේශීය තිත් රූපයේ නම ලියන්න.

.....................................................................................................................................

● අංක **41** සිට **50** තෙක් ඇති ප්‍රශ්න සඳහා දී ඇති හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු සපයන්න.

**41.** පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ..................................... විතත වර්ගයට අයත් වන අතර දවුල ..................................... වර්ගයට අයත් වේ.

**42.** 'වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ' නමැති නූර්ති ගීතයේ තනුව පිළිවෙළින් ..................................... තාලය සහ ..................................... තාලය අනුව නිර්මාණය වී ඇත. ගීතය මධ්‍යයේ දොහොරාවක් ද ඇත.

**43.** ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන් නිර්මාණය කළ ............................... සහ ............................... ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ඔපෙරා වේ.

**44.** ......................., මුද්ගරිකාව සහ ......................... යනුවෙන් මැද කනෙහි පිහිටි අස්ථිකා තුන නම් කළ හැකි ය.

**45.** අශෝකමාලා චිත්‍රපටයේ ගී තනු ..................................... සූරීන් විසින් නිර්මාණය කරන ලද අතර රේඛාව චිත්‍රපටයේ ගී තනු නිර්මාණය කළේ ..................................... සූරීන් විසිනි.

**46.** 'එර්දිවෙලා උඩුගුවනේ වඩින්නේ'..................................... ශාන්තිකර්ම ගීතයක් වන අතර 'ගුණ දැනේ බෝසත් අනේ'..................................... ශාන්තිකර්ම ගීතයකි.

**47.** 'ඇදුරුතුමා වන්න මගේ' යන ගීතය ඇතුළත් 'පේමතෝ ජායතී සෝකෝ' ගීත නාටකය ..................................... ....................... සූරීන්ගේ නිෂ්පාදනයක් වන අතර එහි සංගීත නිර්මාණය ..................................... ....................... සූරීන්ගේ ය.

**48.** ආඬිගුරා, වෙදරාල වැනි චරිත ඇතුළත් රංග සම්ප්‍රදාය ..................................... නමින් ද, සබේ විදානේ, ආරච්චිල වැනි චරිත ඇතුළත් රංග සම්ප්‍රදාය ..................................... නමින් ද හැඳින්වේ.

**49.** නිර්දේශිත ආශාතාත්මක වැලපුම් ගීයක් ලෙස ..................................... ගීය දැක්විය හැකි අතර ..................................... වැලපුම් ගීය අනාඝාතාත්මකව ගැයේ.

**50.** 'රටලිම් ඇරලා පටි ගෙන්නාලා' යන ගී පාද ඛණ්ඩයේ සඳැස්මත් සංඛ්‍යාව ................... ක් සහ ගීමත් සංඛ්‍යාව ................... ක් වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017


| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය II<br>கீழைத்தேய சங்கீதம் II<br>Oriental Music II | 54 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, II කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, III කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කොටස් කිහිපයක් පහත සඳහන් වේ.




(i) ඉහත දැක්වෙන ස්වර සංගති මගින් පිළිබිඹු වන රාග **හතර A, B, C, D** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08 යි.)

(ii) එම රාග අතුරෙන් සමප්‍රකෘති රාග **දෙකක්** නම්කර, එම රාග දෙකෙහි සමානතා **පහක්** අදාළ උදාහරණ සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(iii) ඉතිරි රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාරකර, ඊට අදාළ මාත්‍රා **අටක** තානාලංකාරයක් මාත්‍රා **අටක** තිහායි කොටසක් ද සමග (මාත්‍රා 16ක් වන සේ) ගළපා තාලානුකූල ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

**2.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අදාළ ස්වර ඛණ්ඩ කිහිපයකි.

**(a)** ම් ප ධ ප   ග ම රි ස   ග ම ධ   නි ධ ස්
**(b)** ම ප නි̲ ප   ග̲ ම රි ස   ග̲ ම ධ   ධ නි ස්
**(c)** ම් ප ග ම   ග ග රි ස   ග ම ප   නි නි ස්
**(d)** ම ප ධ ග̲   ම ග̲ රි ස   ග̲ ම ධ   නි̲ ධ ස්

(i) ඉහත රාග **හතර** හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08 යි.)

(ii) ඉහත **(c)** සහ **(d)** යන රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක හෝ අන්තරා කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) ඉහත **(b)** රාගයේ මේලය, ආරෝහණ, අවරෝහණ, වාදි, සංවාදි, රාග ජාති, ගාන සමය, මුඛ්‍යාංගය යන විස්තර ලියන්න. (ලකුණු 04 යි.)

(iv) දීප්චන්දි තාලයේ ඨේකාව ප්‍රස්තාර කරන්න.
ඉහත **(a)** හි සඳහන් ස්වර රචනාව දීප්චන්දි තාලයේ ආවර්ත **දෙකකට** ගැළපෙන පරිදි දීර්ඝකර ප්‍රස්තාර කරන්න. (සියලු ම ස්වර එම අනුපිළිවෙළට ම යොදා ගන්න.) (ලකුණු 04 යි.)

**3.** පහත දැක්වෙනුයේ නිර්දේශිත තාල **පහකට** අයත් තොරතුරු සහිත වගුවකි.

| | අවනද්ධාක්ෂර | තාලයේ නම | මාත්‍රා ගණන | තාල සංකේත පිළිවෙළ | තාල වාද්‍ය භාණ්ඩය |
|---|---|---|---|---|---|
| (a) | ධාගෙ තිරිකිට | A ........... | 12 | X 0 2 0 3 4 | B ........... |
| (b) | ධා තු නා | C ........... | D ......... | E ........... | තබ්ලා |
| (c) | ධා තිං තිං තා | F ........... | 16 | X 2 0 3 | තබ්ලා |
| (d) | ක්‍රිට ධා | G ........... | H ......... | I ........... | J ........... |
| (e) | ති ට කා – | K ........... | L ......... | X 2 0 3 | පඛාවාජ් |

(i) ඉහත වගුවෙහි **A** සිට **L** තෙක් ඇති හිස්තැන්වලට උචිත පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂර ද සමග ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

(ii) **(a)** හා **(d)** යන තාල දෙකේ සමානතා **තුනක්** හා අසමානතා **තුනක්** ලියන්න. (ලකුණු 06 යි.)

(iii) **(e)** තාලය තාල සංකේත සහිත ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

(iv) ඉහත **(e)** තාලය භාවිත කරන ගායන ශෛලිය නම්කර, එම ශෛලියෙහි විශේෂ ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 04 යි.)

(v) **(b)** තාලයේ එක් ආවර්තයක් මත බිහාග් හෝ හමීර් හෝ රාගයකට අනුව තානාලංකාරයක් ලියන්න. (ලකුණු 02 යි.)

## II කොටස

**4.** (i) "ආඝාතාත්මක සහ අනාඝාතාත්මක වශයෙන් මෙහෙ ගී වර්ග කළ හැකි ය." ආඝාතාත්මක මෙහෙ ගීයක සහ අනාඝාතාත්මක මෙහෙ ගීයක මුල් ගී පාදය බැගින් ලියන්න. ඔබ ලියූ එම මෙහෙ ගීත ආඝාතාත්මකව ගැයීමට හා අනාඝාතාත්මකව ගැයීමට හේතු පැහැදිලි කරන්න. (එක් ගී වර්ගයක් සඳහා කරුණු **තුනක්** සෑහේ.) (ලකුණු 08 යි.)

(ii) " ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම ගී" යන මාතෘකාව යටතේ විස්තර කෙරෙන උදාහරණ සහිත ලිපියක් ඔබ පාසලේ බිත්ති පුවත්පතක් වෙනුවෙන් සකසන්න. (ලකුණු 08 යි.)

(iii) සේ ගී සඳහා සුවිශේෂී වන ලක්ෂණ **හතරක්** සහිත කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04 යි.)

**5.** පහත දැක්වෙනුයේ ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් සහ ජන සංගීතාංග කිහිපයකට අයත් තොරතුරු ඇතුළත් වගුවකි.

| | ගීතය/කවිය | රංග සම්ප්‍රදාය/ ගී වර්ගය | රඟ දැක්වූ/ ගැයූ ස්ථාන | යොදා ගන්නා ප්‍රධාන තාල වාද්‍යය | පදනම් වූ සංගීත සම්ප්‍රදාය |
|---|---|---|---|---|---|
| (a) | වාසනා දිනේකි | A ......... | රංග ශාලාව | B ......... | උත්තර භාරතීය |
| (b) | බානු සේ ගිමා | ප්‍රශස්ති | C ......... | ගැට බෙරය | D ......... |
| (c) | වෙදා නටන්නේ | E ......... | කමත | F ......... | ගැමි සංගීතය |
| (d) | ගම්භීරත් තාලෙට | G ......... | පහන් මඩු<br>ගම් මඩු | දවුල | H ......... |
| (e) | මුනිඳුන් දම් සඟ | I ......... | කවිකාර මඩුව | J ......... | දක්ෂිණ භාරතීය |
| (f) | පාට වරුණ පුත | K ......... | කමත | උඩැක්කිය | L ......... |
| (g) | සෝබමාන දේව පුරා | M ......... | N ......... | තබ්ලාව | O ......... |
| (h) | පෙමින මිතුරු | පහතරට සින්දු වන්නම් | දෙවොල් මඩු | P ......... | ගැමි සංගීතය |

(i) ඉහත වගුවෙහි **A** සිට **P** තෙක් හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුර ඉංග්‍රීසි අක්ෂරය ද සමගින් ලියන්න. (ලකුණු 08 යි.)

(ii) **(e)** තීරුවෙහි ඇතුළත් රංග සම්ප්‍රදාය හෝ ගී වර්ගය පිළිබඳ (එම තීරුවෙහි සඳහන් නොවන) සුවිශේෂී ලක්ෂණ **පහක්** ලියන්න. (ලකුණු 05 යි.)

(iii) **(f)** තීරුවෙහි ඇතුළත් රංග සම්ප්‍රදාය හෝ ගී වර්ගය සඳහා අදාළ වන (එම තීරුවෙහි සඳහන් නොවන) සංගීත ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) **(g)** තීරුවෙහි ඇතුළත් ගී වර්ගය සඳහා තනු නිර්මාණයෙන් දායක වී ඇති විදේශීය සංගීතඥයින් **තිදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

## III කොටස

**6.** එක් මාතෘකාවකට කරුණු **පහක්** ඇතුළත් වන සේ පහත සඳහන් මාතෘකා **හතරක්** පිළිබඳ අවශ්‍ය උදාහරණ සහිතව විස්තර කරන්න.

(i) ගායන සමය

(ii) භාත්ඛණ්ඩේ පඬිතුමා

(iii) කවිකාර මඩුව

(iv) සංගීතඥ බීතෝවන්

(v) කර්ණාටක සංගීතය

(vi) චතුරංග ගායන ශෛලිය (ලකුණු $05 \times 4 = 20$ යි.)

**7.**



(i) ඉහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ ස්කේලය (scale) නම්කර, ටයිම් සිග්නේචරය (time signature) ලියා දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) එම පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iv) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ සම්පූර්ණ ගැලීම් සටහනක් සකස්කර, එහි වර්ග **හතරකට** පමණක් අදාළ වන සංගීත භාණ්ඩ **තුන** බැගින් ලියන්න. (ලකුණු 10 යි.)

**8.** (i) (a) ශ්‍රී ලංකාවේ ග්‍රැමෆෝන් සංගීතය

(b) ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය

(c) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

ඉහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන උදාහරණ සහිත ව වෙන වෙන ම විස්තරයක් කරන්න.

ඔබ තෝරාගත් මාතෘකා දෙක විස්තර කිරීම සඳහා පහත සඳහන් කරුණුවලින් **හතර** බැගින් ද අදාළ කරගන්න.

❋ ආරම්භය

❋ අනුකාරක තනු

❋ ස්වතන්ත්‍ර නිර්මාණ

❋ ගායනා කළ කණ්ඩායම් හෝ ගායක ගායිකාවන්

❋ සංගීත ආභාස, වාද්‍ය භාණ්ඩ හා තාක්ෂණික මෙවලම්

❋ පද රචනාවන්හි විශේෂතා (ලකුණු 16 යි.)

(ii) සිංහල බසින් රචිත ඔබ කැමති ඕනෑම සරල ශාස්ත්‍රීය ගීතයක් තෝරා ගෙන, එහි දැක්වෙන ශාස්ත්‍රීය ලක්ෂණ **හතරක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

❋ ❋ ❋

More Past Papers at
tamilguru.lk